22120267

International Baccalaureate®
Baccalauréat International
Bachillerato Internacional

**SINHALESE A1 – STANDARD LEVEL – PAPER 1**
**SINGHALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 1**
**SINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 1**

Thursday 10 May 2012 (morning)
Jeudi 10 mai 2012 (matin)
Jueves 10 de mayo de 2012 (mañana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Write a commentary on one passage only. It is not compulsory for you to respond directly to the guiding questions provided. However, you may use them if you wish.
- The maximum mark for this examination paper is [25 marks].

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- N'ouvrez pas cette épreuve avant d'y être autorisé(e).
- Rédigez un commentaire sur un seul des passages. Le commentaire ne doit pas nécessairement répondre aux questions d'orientation fournies. Vous pouvez toutefois les utiliser si vous le désirez.
- Le nombre maximum de points pour cette épreuve d'examen est [25 points].

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Escriba un comentario sobre un solo fragmento. No es obligatorio responder directamente a las preguntas que se ofrecen a modo de guía. Sin embargo, puede usarlas si lo desea.
- La puntuación máxima para esta prueba de examen es [25 puntos].


© International Baccalaureate Organization 2012

**පහත දැක්වෙන ඡේද අතුරෙන් එකක් සඳහා විවරණයක් සපයන්න.**

**1.**

ගිනි ගත් යසුණු රැසක් මෙන් කකියන, මරු කතරක් වන් වාලුකා තලයක අසකු පිටින් ගමන් යන තරුණ පුරුෂයෙක් දක්නා ලැබේ. බලවත් අවු රස්නෙන් තැව් තැවී දහ දිය සල සලා පෙනෙන තෙක් මානේ මහ දෙ පස, නිතොර සෝදිසියෙන් බල බලා, ගමන් කරන මේ පුරුෂයාට බැලූ බැලූ අතින් පෙනෙන්නේ, මනා සේ සුදු වැලි අතුළ සිත්කලු උයනෙක තැන තැන රෝපිත මල් ගොමු සමූහයක් වන් වල් පඳුරු පමණකි; බැදි කුට්ටි පමණකි. මේ වැල් බැඳුණු අතු පතර ඇති, මහ ගසින් සැදුම් ලත්, අඳුරු වනයක් නොවේ. එසේ ද වුව, සෙසු නොයෙක් අතින් සර්වාංගික සම්පූර්ණ මහ වනයකි. කැලය සුලභ නො වන නිසා නො ව ජලය සුලභ නො වන හෙයින්, මෙවැනි බිම වනැතුනට හා වන සූකරයනට ඒ තරම් ප්‍රියමනාප නැති වත්, දිවි–මුව–වලස් ආදී සිවුපා ගණයටත්, මොනර–සැවුල්–පරෙවි ආදී පක්ෂි ගණයටත්, නා–පොළොං ආදී සර්ප ගණයටත් අහිතකර නො වන හෙයින් මෙහි ඒ බඳු සත්තු නො මඳව වෙසෙති.

මේ තරුණ අශ්වාරෝහක තෙමේ නිතොර ඈත සිට මහ දෙ පස බලන්නේ, වන මෘග භයින් ම නොවේ. අමනුෂ්‍ය භයකින් ද නොවේ. ඒ හැමට වඩා ඔහුගේ නව යෞවන චිත්තය තැවෙන්නේ පර සතුරු බියෙනි. ඔහු මේ ගමන් කරන්නේ තමනට සතුරු දනවුවකය. පස් විසි වියෙහි සිටි ප්‍රාං දේහයෙන් ද, අභිජාත ලක්ෂණයෙන් ද, කාය බල වික්‍රමයෙන් ද, අනුභාවසම්පන්න විලාසයෙන් ද, අනූන වූ මොහු මේ වෙස්වලා යන ගමනකි. රන් හුයෙන් ගෙත්තම් කොට නිමවන ලද නිල්වන් විලූද සැට්ටයක්, එවැනිම කලිසමත්, රන්වන් කුරුලු පිහාටුවකින් සරසන ලද විලූද තොප්පියත් නිසා ඈත සිට බලන්නකුට නම් ඔහු පෙනෙන්නේ, ප්‍රතිකාල් රදල කුමාරයකු මෙනි. එසේ වුව ද හේ තරුණයෙකි. ශරීර වර්ණයෙන් ද ඔහු සුදුය. ප්‍රතිකාල් මනුෂ්‍යයකු පමණ හෙල්මැලි නොවන නමුත් ඔහුගේ වැනි ගජ දන්ත වර්ණය සිංහලයන් කෙරේ දක්නා ලැබෙන්නේ ඉතා ම කලාතුරකිනි.

මේ සූර්ය තාපය ඔහුට ඉවසුම් නො දෙන්නේය. ඔහු රට නුපුරුදු ය. ඔහු පැමිණියේ මෙවැනි නිසරු බිමක සිට නො වේ. පලු පල මල් බර නොයෙක් තුරු ලිය පෙළින් සැදුණු ගිරි කඳුරු දැදුරු කෙරෙමින්, මඳ පවනට සිහිලස දෙමින්, දුටු දුටු සතුන් නෙත් සිත් පොළඹවමින් ඇද හැළෙන පළිඟු මිණි වන් දිය දහර ඇති, එබඳු දිය දහරින් යැපෙන නොයෙක් කෙත් වත් ගෙවුයන් හා ගම් නියම්ගම් ඇති, සශ්‍රීක භූමි ප්‍රදේශයක සිටය. ඔහු දැන් දෙතුන් දිනක සිට කරන ගමන් ඇති වත්, මෙබඳු මහ පාළුවකට පැමිණියේ අද ය. තම ගමන අවසන් වන තැන, වැසි පල හින, නිසරු වැලි තලයක් ඇති බව කියන ලදු වත්, එය මෙවැනි මහ පාළුවක් බව ඔහු නො දත්තේ ය.

ඩබ්ලිව්. ඒ. සිල්වා, සුනේත්‍රා හෙවත් අවිචාර සමය (1955)

– මෙම කොටසෙන් නිරූපණය කර ඇත්තේ කෙබඳු අවස්ථාවක්දැයි පැහැදිලි කරන්න.

– මෙහි නිරූපිත කථානායක චරිතයෙහි අභ්‍යන්තර සිතුවිලි හා බාහිර පෙනුම ඉදිරිපත් කර ඇත්තේ කෙසේද?

– කථානායකයා ගමන් කරන මාර්ගය අවට පරිසරය කොතරම් සාර්ථක ලෙස නිරූපණය කර ඇද්ද?

– මෙහි යොදාගෙන ඇති භාෂා ශෛලියේ විශේෂ ලක්ෂණ මොනවාද?

**2.**

## රන් එතනාට කියන කවි

රන් එළියට හැන්දෑවේ මුදු කෙහෙ දිලිසෙන්නේ
රන් ගෝමර පෙති ඉහිලා ළමැද බබුලුවන්නේ
රන් වන් වී කරලක් මෙන් බිමට නැමී ඉන්නේ
රන් එතනා ඉපනැල්ලේ මොනවද අවුලන්නේ

උදේ ඉඳන් වැඩ කරලා දැනුයි ගොඩට එන්නේ
වෙලේ තමයි ජීවිතයම අවුවට කර වෙන්නේ
උඹේ කැකිරි සිනා පොදක් මා වෙත හෙලමින්නේ
හිතේ තියෙන දුක මඳකට දුරු කරවාපන්නේ

මාස ගණන් වැස්ස නැතුව දිගටම පායන්නේ
වේලි ලියදි දිය හිඳිලා ඉරි තැලිලා යන්නේ
වේලුණු බිම ගිනියම් වී අවුව කැකෑරෙන්නේ
පාළු කුඹුර ගැන සිහිවන කලට පපුව දන්නේ

බැන්ද වරල පීරාගෙන හෙමින් සැරේ එන්නේ
හැන්දෑවේ සිහිල් සුළඟ ඇඟ වට නලියන්නේ
අන්දකාර දුරු කරවන මැණික් පාන වැන්නේ
කින්ද පාළු කුඹුරේ තව තනියම පසු වන්නේ

කාලෙට මහ වැහි වැහැලා සාගත දුරු වෙන්ටයි
වේලි, ලියදි, ගං ඇල, දොල පිරී ගලා යන්ටයි
වේළුණු වැලි බිම තෙත්වී නැවුම් සුවඳ එන්ටයි
සාරව මුළු පොළොව එයින් ජීවය උතුරන්ටයි

ළා ගොයමේ නිල්ල ඇවිත් පොළොව වසා ගන්ටයි
හිනා කිරෙන් කිරි වැදිලා කරලින් බර වෙන්ටයි
ඇහේ පාට රන් කරලෙන් අස්වනු පිදෙන්ටයි
හිතේ සියලු දුක් කරදර අමතක කර ලන්ටයි

රන් එළියට හැන්ඳෑවේ මුදු කෙහෙ දිලිසෙන්නේ
රන් ගෝමර පෙති ඉහිලා ළමැද බබුලුවන්නේ
රන් පාටට එකතු වෙලා අඳුර ගලා එන්නේ
කින්ද පාළු කුඹුරේ තව තනියම පසුවන්නේ

මහගම සේකර - නව කවි සරණිය (1976)

– මෙම කවි පන්තියෙන් කෙබඳු අවස්ථාවක් නිරූපණය වී ඇද්ද?

– එම වර්ණනාව සඳහා කවියා යොදාගෙන ඇති කාව්‍ය උපක්‍රම පිළිබඳ ඇගයීමක් කරන්න.

– ගැමි පරිසරය හා එයින් මතු වන හැඟීම් කවියා කොතරම් දුරට සාර්ථක ලෙස වර්ණනා කර ඇද්ද?

– මෙය රසවත් නිර්මාණයක් වීමට, යොදාගෙන ඇති භාෂාව කොතෙක් දුරට යෝග්‍යද?